| |
|---|
| කැලණිය අධ්‍යාපන කලාපය |
| දෙවන වාර පරීක්ෂණය - 2017 |

09 ශ්‍රේණිය — පෙරදිග සංගීතය — කාලය පැය 1½ යි.

නම : ...............................................................................................................

## I කොටස

- **1 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නි ස ග ම ප , ප නි ස ග රි නි ස මෙවැනි ස්වර සංගති යෙදෙන නිර්දේශිත රාගයක ජාතිය විය හැක්කේ,
    (i) සම්පූර්ණ (ii) ඖඩව - සම්පූර්ණ (iii) ෂාඩව - සම්පූර්ණ (iv) ඖඩව

02. යමන් හා භිම්පලාසි යන රාග දෙකෙහි පිළිවෙළින්,
    (i) ත්වීර මධ්‍යමය හා කෝමළ ග, නි යන ස්වර විකෘති ස්වර හැටියට යෙදේ.
    (ii) රාග දෙක සඳහාම ශුද්ධ ස්වර පමණක් යෙදේ.
    (iii) යමන් රාගය සඳහා ශුද්ධ ස්වර 05 ක් ද, භිම්පලාසි රාගය සඳහා ශුද්ධ ස්වර 07 ම ද යෙදේ.
    (iv) රාග දෙක සඳහාම විකෘති ස්වර හැටියට කෝමල ග , නි යන ස්වර යෙදේ.

03. සරල ගීයක් හා එහි තනුව නිර්මාණය සඳහා පාදක කොටගෙන තිබෙන රාගයේ නම ඊට ඉදිරියෙන් සඳහන් කොට ඇති වගන්ති 04 ක් පහත දැක්වේ. ඉන් අසත්‍ය වූ වගන්තිය තෝරන්න.
    (i) ස්වර්ණ ප්‍රදීපාය මාන - යමන් (ii) සීගිරියේ සිතුවම් රමණී - භිම්පලාසි
    (iii) සැන්දෑ අහසේ ඉරට මුවාවෙන් - භිම්පලාසි (iv) සාදු දන්ත දා වඩිමි - යමන්

04. මැදුම් මහ දෙතිතට අයත් බෙර පදයකි,
    (i) දො ං / දො ං පි ං / පි ං / ග පි ග ත (ii) දො ං / පි ං ත / ග ත / දො ං ත
    (iii) දො මි කි ට / කි ට දො මි (iv) දො ං දො / පි ං ග ත / පි ග ත / දො ං ත කු

05. සුළු මැදුම් දෙතිතට අයත් තිත් රූපය බටහිර ක්‍රමයට හඳුන්වන්නේ,
    (i) 4/4 Rhythm (ii) 5/8 Rhythm (iii) 3/4 Rhythm (iv) 7/8 Rhythm

06. දීප්චන්දි තාලයට අනුව ගායනා කළ හැකි ගීතයකි,
    (i) සුවඳ රෝස මල් නෙලා (ii) සැඳෑ කළුවර කුරගගා විත්
    (iii) ලෝකයක් නසන්නට රුදුරු අවි අතදරා (iv) සුවඳ පත්ම ඕළු ආදි

07. මාත්‍රා 10 යි. විභාග 04යි. ඛලිය 06 වන මාත්‍රාව මත පිහිටයි. මෙම විස්තරයන්ට අදාළ වන හින්දු ස්ථානී තාලය,
    (i) දාදරා තාලය (ii) දීප්චන්දි තාලය (iii) ඣප් තාලය (iv) කෙහෙර්වා තාලය

08. මධ්‍යමය ශ්‍රැති ස්වරය ලෙස ගෙන කාෆි රාගයේ ආරෝහණ / අවරෝහණ ස්වර වාදනය කරන විට,
    (i) ග ස්වරය වෙනුවට ධ ස්වරය යෙදේ. (ii) නි ස්වරය වෙනුවට ග ස්වරය යෙදේ.
    (iii) ම ස්වරය වෙනුවට නි ස්වරය යෙදේ. (iv) ධ ස්වරය වෙනුවට රි ස්වරය යෙදේ.

09. ශ්‍රැති මාරු කරලීමේ ක්‍රියාවලිය සම්බන්ධව සාවද්‍ය (වැරදි) ප්‍රකාශය තෝරන්න.
    (i) මෙම ක්‍රියාවලිය බටහිර සංගීතයේදී Transpose යනුවෙන් හඳුන්වයි.
    (ii) එකම ස්වර කණ්ඩය විවිධ ශ්‍රැති වලින් වාදනය කළ හැකිය.
    (iii) ශ්‍රැතිය වෙනස් කොට වාදනය කළ විට ගීතයේ තනුවෙහි වෙනසක් සිදු වේ.
    (iv) කුමන ස්වරයක් ශ්‍රැති ස්වරයක් ලෙස භාවිත කළ ද මූලික නාද රටාවේ වෙනසක් සිදු නොවේ.

10. ජන ගී ඇසුරින් තනුව නිර්මාණය කොටගෙන ඇති ගීත යුගලයකි,

(i) සීගිරියේ සිතුවම්, රමණී / සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට

(ii) යමුනා ගංතෙර ලපළු ලතා සෙවණේ / සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්

(iii) රන්වන් කරල් සැලෙයි / ස්වර්ණ ප්‍රදීපය මාන

(iv) මල් සරා බැල්ම හෙලා / ජයසිරි මහ බෝධී

* **11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති වගු සටහන උපයෝගී කොට ගන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| රබාන / තබ්ලාව | බටනලාව / හොරණෑව | ජල තරංග / තාලම්පට | එස්රාජය / තාම්පුරාව |

11. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව මෙම කොටසට අයත්වන සංගීත භාණ්ඩ නොමැත.

(i) A (ii) B (iii) C (iv) D

12. සුෂිර හා අවනද්ධ භාණ්ඩ ඇතුළත් වන කොටස් දෙක වන්නේ පිළිවෙළින්,

(i) B - A (ii) B - C (iii) A - B (iv) A - D

13. කඩිප්පුව ආධාරයෙන් වයන සංගීත භාණ්ඩ අයත් වන කොටස,

(i) A (ii) B (iii) C (iv) D

14. මෙම වගුවේ ආතත ගණයට අයත් සංගීත භාණ්ඩයක් ඇතුළත්ව ඇති කොටස,

(i) A (ii) B (iii) C (iv) D

15. ශාස්ත්‍රීය ගායනාවන්හිදී ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා පමණක් වයනු ලබන ස්වර වාද්‍ය භාණ්ඩය ඇතුළත්ව ඇති කොටස,

(i) A (ii) B (iii) C (iv) D

16. D♭ E♭ F# යන බටහිර ස්වර සංකේතවත් කළ හැකි තවත් ආකාරයක් වන්නේ,

(i) E# G# A# (ii) C# D# G♭ (iii) B♭ D♭ F♭ (iv) G# A♭ C#

17. ඉහත ප්‍රශ්නයට අදාළ බටහිර ස්වර තුන පෙරදිග ක්‍රමයට ලියූ විට ලැබෙන්නේ,

(i) ග ම́ ධ (ii) රි නි ධ (iii) රි ග ම́ (iv) ග ම́ ධ

18. හින්දු ස්ථානි රාගධාරී සංගීතයේ ආභාෂය මත ස්ථායි, අන්තරා ආකෘතියට අනුව නිර්මාණය වී ඇති දෙවියන්ගේ ගුණ කියවෙන සරල ශාස්ත්‍රීය හින්දි ශෛලියට සමාන කමක් දක්වන සිංහල ගීතයකි,

(i) කෝටු කෑලි සොයාලා (ii) ගමේ ගොඩේ සිදාදියේ කවුරුත් වාගේ

(iii) මංගලම් ජය මංගලම් (iv) පුදමු මේ කුසුම්

19. හින්දුස්ථානිරාග,තාල යොදා ගනිමින්ආගමික නැඹුරුවක් ද ඇතිවන පරිද්දෙන් නිර්මාණය රගනුලැබූ මුස්ලිම් ජනයා අතර ප්‍රචලිත ගායන ශෛලිය,

(i) කව්වාලි (ii) භජන් (iii) සර්ගම් (iv) ඛ්‍යාල්

20. "රිදියෙන් තනාලා රත්රන් ඔපලා කැරලි කෙටුවයි දෑ කැත්තේ" මෙය,

(i) නෙළුම් ගීයකි. (ii) කමත් ගීයකි. (iii) ගොයම් ගීයකි. (iv) සේ ගීයකි.

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 2 ක් තෝරාගෙන ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

01.

| **රාගය** | **රාගයට අදාළ ස්වර පාදය** |
|---|---|
| A | නි් ස ම ගු රි ස \| ප නි් ස ස \| නි් නි් ස ම \| ම - ගු ගු |
| B | ග රි නි් රි \| ස - නි් රි ග ම් \| ප ම් ග ප \| රි ග රි ස |

(i) ඉහත (A) හා (B) වලට අයත් වන රාග 2 නම් කරන්න. (ලකුණු 02)

(ii) (A) හා (B) යන රාග 2 ට අදාළ ලක්ෂණ 04 බැගින් වගුගත කරන්න. (ලකුණු 04)

(iii) එම රාග 2 න් ඔබ කැමති රාගයක් තෝරාගෙන එහි මධ්‍යලය /සර්ගම් හෝ ලක්ෂණ ගීයක ස්ථායී කොටස ගීත - ස්වර ප්‍රස්ථාර කර දක්වන්න. (ලකුණු 04)

02. රූපය (1)



රූපය (2)



(i) ඉහත (1) හා (2) යන රූප මඟින් දක්වා ඇති බටහිර තාල රූපයන්ට ගැලපෙන දේශීය තිත් හා හින්දුස්ථානී තාලයන්ගේ නම් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ඉන් කැමති තාලයක් හෝ තිත් රූපයක් තෝරාගෙන ඊට අදාළ ඨේකාව හෝ බෙර පදය නිවැරදිව ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 04)

(iii) ඉහත කැමති තාල රූපයකට ගැලපෙන අයුරින් ස්වර රචනාවක් හෝ ගී පද රචනාවක් නිර්මාණයකර එය ප්‍රස්ථාර ගත කර දක්වන්න. (පාද 02 ක් පමණක් ප්‍රමාණවත් වේ) (ලකුණු 04)

03. (i) දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව පහත සඳහන් වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| **වාදනය කරන ආකාරය** | **භාණ්ඩ වර්ගය** | **නිදසුන්** |
|---|---|---|
| අතින් පමණක් | ආනත | |
| කෝටුවෙන් (කඩිප්පුවෙන්) පමණක් | | තම්මැට්ටම |
| අතින් හා කෝටුවෙන් | | |
| සුළගේ ආධාරයෙන් | | |
| තැලීමෙන් | | |

(ලකුණු 04)

(ii) ඉන් කැමති අවනද්ධ භාණ්ඩයක රූප සටහනක් ඇඳ එහි කොටස් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) එම භාණ්ඩයට අදාළව කෙටි සටහන් ලියන්න. (ලකුණු 04)

04. ගීතය (1) - උදයට පායන හිරු දෙවියන්ටයි.

ගීතය (2) - ඉපල් පිටින් ගහන අපව පිටට ඉහිර වන්නේ

ගීතය (3) - ඉහළ වෙලේ තියන බැතා පහල වෙලේ තිබෙන බැතා

(i) දේශීය ගැමි ගී වර්ග 03කට අයත් ගීත 03 ක් ඉහත දක්වා ඇත. එම එක් එක් වර්ගයට අදාළ වන ගී වර්ගය ඒ ඉදිරියෙන් ලියන්න. (ලකුණු 03)

(ii) එම එක් ගී විශේෂයක් තෝරාගෙන ඒ හා සම්බන්ධ සුවිශේෂී කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) පොදුවේ ගත් කළ ගැමි ගී වලට ආවේණික වූ ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)